tamilguru.lk

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දකුණු පළාත

## දකුණු පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2023

### සංශෝධනය 01

දකුණු පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවීම සඳහා 2023.10.11 දින දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කරන ලද විභාග නිවේදනයේ උපලේඛණ 01හි අනු අංක 08,13,29 හා අනු අංක 56 පහත අයුරින් සංශෝධනය කරන ලද බව කාරුණික ව දැනුම් දෙමි.

| *අනු අංක* | *විෂය* | *මාධ්‍යය* | | | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| | | *සිංහල* | *දෙමළ* | *ඉංග්‍රීසි* | |
| 08 | නාට්‍ය හා රංඟ කලාව | √ | √ | X | නාට්‍ය හා රංග කලාව ප්‍රධාන විෂය ලෙස හදාරා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 13 | පුරවැසි අධ්‍යයනය | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රජා පාලනය හා පුරවැසි අධ්‍යාපන විෂය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය හෝ මානව විද්‍යාව (විශේෂ) උපාධිය හෝ<br>සමාජ විද්‍යාව හෝ දේශපාලන විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 29 | කෘෂි විද්‍යාව | √ | X | X | විද්‍යාවේ දී කෘෂි තාක්ෂණය හා කළමණාකරණ උපාධිය (B.Sc. Agricultural Technology and Management) හෝ කෘෂි විද්‍යාව/කෘෂිකර්මය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 56 | විශේෂ අධ්‍යාපනය | √ | X | X | විශේෂ අධ්‍යාපනය පිළිබඳ උපාධියක් හෝ අන්තර්ක්‍රියාකාරී අධ්‍යාපනය පිළිබඳ උපාධියක් හෝ කථනය සහ ශ්‍රවණය පිළිබඳ උපාධියක් හෝ බ්‍රේල් මාධ්‍යය ඔස්සේ හදාරන ලද සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |

මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වේ. මෙම නිවේදනයේ සඳහන් තොරතුරු හැර මුල් විභාග නිවේදනයේ සඳහ අනෙකුත් සියළුම තොරතුරු නොවෙනස් ව පවතී.

**ගාමිණී වීරවික්‍රම**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත